**ශ්‍රී ලංකා හොකී සම්මේලනය - 2022**

**--------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා හොකී සම්මේලනයේ ("සම්මේලනය") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම්ගිණුම, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සම්මේලනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සම්මේලනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සම්මේලනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සම්මේලනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සම්මේලනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සම්මේලනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සම්මේලනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සම්මේලනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සම්මේලනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සම්මේලනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව (SMEs සඳහා SLFRS) ආදායම් සහ වියදම් හිලව් නොකල යුතුයි. කෙසේ වෙතත් සම්මේලනය Ground Turf ගිණුමේ ආදායම වූ රු. 4,283,456 ක වටිනාකම එහි ආදාල වියදම රු. 143,980 ක් හිලව් කර මූල්‍ය ප්‍රකාශන වල රු. 4,139,476 ක් ලෙස සටහන් කර තිබුණි. | භූමි නිලධාරීන්ගේ අතිකාල ගෙවීම් සහ ක්‍රීඩා පිටිය සහ ශ්‍රවණාගාරය අලුත්වැඩියා කිරීම් ප්‍රතිපූරණය කිරීම සඳහා රු. 143,980ක් වූ වියදම් හිලව් කර ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කළ යුතුය |
| ආ) | රු. 19,152 අතිකාල ගෙවීම සඳහා වූ ගෙවීම් වවුචර වියදම් ලෙස සටහන් කර නොතිබුණි. | ඉදිරි වසරේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |
| ඇ) | සම්මේලනය 2022 වර්ෂය සඳහා විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සපයා නොතිබුණි. | ඉදිරි වසරේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | d |

-එම-

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| අයිතමය | වටිනාකම<br>රු. | සාක්ෂි නොවීම | කළමනාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) වියදම් | 2,674,968 | ගෙවීම් වවුචර | ඉදිරි වසරේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | වියදම් සත්‍යාපනය කිරීම සඳහා විගණනය වෙත ප්‍රමාණවත් ලිඛිත සාක්ෂි සපයා තිබිය යුතුය. |
| (ආ) වියදම් | 233,097 | අවසරයන් සහ අනුමැතීන් | -එම- | -එම- |
| (ඇ) වියදම් | 2,378,374 | ඉන්වොයිසිය සහ රිසිට්පත් | -එම- | -එම- |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ සම්මේලනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු 2,460,502 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 35,107 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,425,395ක වර්ධනයක් නිරීක්ෂණය විය. මුළු ආදායම් රු. 21,441,311 කින් සහ මුළු වියදම් රු. 19,015,916 කින් වැඩි වීම මෙම වර්ධනය සඳහා හේතු වී තිබුණි.

## 3. ව්‍යාපෘති වල ප්‍රමාදයන්

---------------------------

| විගණන නිරීක්ෂණ<br>----------------- | කළමනාකරණයේ අදහස් දැක්වීම්<br>------------------------ | නිර්දේශය<br>---------------------- |
|---|---|---|
| ශ්‍රී ලංකාවට අයත් කෘත්‍රිම හොකී ක්‍රීඩාංගණ දෙකක් පමණක් වුවද 2019 වසරේ සිට අලුත්වැඩියා කටයුතු හේතුවෙන් මාතලේ හොකී ක්‍රීඩාංගණයේ ක්‍රීඩා කටයුතු නතර කර තිබුණි. කොළඹ | ආසියානු හොකී සම්මේලනය (AHF) විසින් යවන ලද අවබෝධතා ගිවිසුම් | නව තණතිල්ල ප්‍රතිස්ථාපනය කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| ටොරින්ටන් හි පිහිටි අබලන් සහ භාවිතයට නුසුදුසු හොකී තණතිල්ල සම්බන්ධයෙන් ශ්‍රී ලංකා හොකී සම්මේලනය සිදු කල දැනුම්දීමකට අනුව ආසියානු හොකී සම්මේලනය හොකී තණතිලි වෙනුවට ඔලිම්පික් ප්‍රමිතියෙන් යුතු පොලිටන් හොකී තණතීරුව ඉදිකිරීම සඳහා ඩොලර් 250,000 ක් ප්‍රදානය කිරීමට එකඟ වී ඇත. නමුත් තණතිල්ල කඩිනමින් ප්‍රතිස්ථාපනය කිරීමට කටයුතු කර නොතිබුණි. | කෙටුම්පත (MOU) අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා ක්‍රීඩා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.<br>ආසියානු හොකී සම්මේලනය විසින් 2020 වර්ෂයේදී ප්‍රදානයක් ලබා දීමට යෝජනා කර ඇතත්, ක්‍රීඩා අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් එම ප්‍රදානය ලබා ගැනීමට නොහැකි විය. | |

## 4. වගවීම සහ යහපාලනය

### 4.1 ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| 2016 අංක 01 ජාතික ක්‍රීඩා සංගම් රෙගුලාසියේ 7 (xii) වගන්තියට අනුව, ක්‍රියාකාරී සැලැස්ම වසර ආරම්භ වීමට මාස තුනකට පෙර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය සඳහා යවා නොතිබුණි. | ඉදිරි වසරේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | ජාතික ක්‍රීඩා සංගම් නීතියේ නියමයට අනුව ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නොපමාව ඉදිරිපත් කළ යුතුය. |

### 4.2 ආයතනික සැලැස්ම

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| 2016 7(xi) අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගමයේ නියෝගයට අනුව සම්මේලනය විසින් නිසි ආයතනික සැලැස්මක් සකස් කර නොතිබුණි | 2023/2024 වසර සඳහා ආයතනික සැලැස්ම ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | ආයතනික සැලැස්ම නිවැරදිව සකස් කර විධායක කමිටුවේ අනුමැතිය සහිතව ඉදිරිපත් කළ යුතුය. |

## 5. ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 5.1 ගෙවිය යුතු ගිණුම

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|

| | | |
|---|---|---|
| උපචිත සහ අනෙකුත් ගෙවිය යුතු අගය තුල ඇතුළත් රු. 1,289,591ක වටිනාකම වසර හතරක් පුරා පියවා නොතිබුණි. | ඉදිරි වසරේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | නිරවුල් කළ උපචිත සහ ගෙවිය යුතු ශේෂයන් සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු අතර නිරවුල් නොකරන ලද ශේෂයන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |